**ශීර්ෂය 194 - විදුලි සංදේශ විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යාංශය**
**-----------------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

විදුලි සංදේශ, විදේශ රැකියා හා ක්‍රීඩා අමාත්‍යාංශයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විදුලි සංදේශ, විදේශ රැකියා හා ක්‍රීඩා අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 19 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 දෙසැම්බර් 11 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/19 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කල එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට විදුලි සංදේශ, විදේශ රැකියා හා ක්‍රීඩා අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කර ගන්නා බවට තහවුරු කිරිමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනිමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීමට හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීමෙන් වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.

- අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබා ගන්න ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමණාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) වගන්තිය හා 38 වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය තත්ත්ව ප්‍රකාශය අනුව දේපල පිරියත හා උපකරණ වටිනාකම රු.1,513,388,244 ක් වූ අතර එය මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය අනුව රු.2,334,438,176 ක් වූයෙන් රු.821,049,932 ක් වූ මූල්‍ය නොවන වත්කම් අඩුවෙන් ගිණුම්ගත වී තිබුණි. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව සකස් කිරීමට අවධානය යොමු විය යුතු වීම. | නොනිමි වැඩවල වටිනාකම නිම් ස්ථාවර වත්කම්වල වටිනාකම ගණන් බැලීමේදි ඉවත්වන බැවින් මූල්‍ය නොවන වත්කම් අඩුවෙන් ගිණුම්ගත වී නොමැත. |

### 1.6.2 නීති,රීති රෙගුලාසි වලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති,රීති හා රෙගුලාසිවල විධිවිධාන වලට අනුකූල නොවූ අවස්ථා පහත පරිදි විග්‍රහ කර දැක්වේ.

| විගණන නිරීක්ෂණ<br>නීති රීති රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br><br>මුදල් රෙගුලාසි 104(4) සහ රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක PFD/RED/ 2015 /08 පොදු (1) | (i) අමාත්‍යාංශය සතු වාහනයකට 2017 වර්ෂයේදී සිදු වී තිබූ අනතුර හේතුවෙන් රු.2,969,905 ක ඇස්තමේන්තුගත අලාභයක් සිදු වී තිබුණද ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීම වර්ෂ 2 ½ ක් ප්‍රමාදකර තිබුණි. තවද මෙම අලාභය පිළිබඳ වගකිවයුතු නිලධාරීන්, හඳුනා ගැනීම සඳහා විධිමත් පරීක්ෂණයක් සිදුකල බවට තහවුරු නොවුණි. එමෙන්ම අළුත්වැඩියාව සඳහා රු.744,700 ක් වැය වූ බව සහ එම මුදල රක්ෂණය මඟින් ආවරණය වී ඇති බවට හේතු ඉදිරිපත් කර ඉදිරි පරීක්ෂණ අත්හිටුවා තිබුණි. | මෙම අනතුර හේතුවෙන් රජයේ දේපලට සිදුවී ඇති අලාභහානිය පිළිබඳ මුදල් රෙගුලාසි සහ චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | මෙම වාහනය රැගෙන ගිය නිලධාරියා විසින් අනතුර සිදු වීමෙන් පසුව වාහනය පන්නිපිටියේ පිහිටි පෞද්ගලික ගරාජයකට ගෙන ගොස් දමා ඇත. එහි අලුත්වැඩියාව සම්බන්ධයෙන් පරීක්ෂණ කමිටුවක් පත් කල අතර එහි නිර්දේශ වූයේ ද ඉහත කී පෞද්ගලික ගරාජයෙන් රක්ෂණාවරණය මඟින් ආවරණය වන මුදලට යටත්ව අලුත්වැඩියා සිදු කරන ලෙසයි. ඒ අනුව අලුත්වැඩියා කටයුතු එම ගරාජයෙන් සිදු කල අතර ඒ සඳහා වැයවූ රු.744,700 ක් වන මුලු මුදලම රක්ෂණ ආයතනය විසින් ගෙවා ඇත. |

| | | | |
|---|---|---|---|
| | (ii) සමාලෝචිත වර්ෂයේදී වාහන දෙකකට සිදුවී ඇති අනතුරු හේතුවෙන් සිදුකරන ලද අළුත්වැඩියාවන්ට අදාලව එකතුව රු.151,250 ක අලාභය රක්ෂණ ආයතනයෙන් ආවරණය වී ඇති බවට හේතු ඉදිරිපත් කර මුදල් රෙගුලාසි ප්‍රකාරව පරීක්ෂණ පවත්වා නොතිබුණි. | රජයේ දේපලකට පාඩුවක් හෝ අලාභහානියක් සිදු වූ වහාම එහි ප්‍රමාණය හා හේතුව සහ ඊට වගකිව යුත්තන් තීරණය කිරීම සඳහා මුදල් රෙගුලාසි ප්‍රකාරව පරීක්ෂණ කටයුතු සිදුකළ යුතු වීම. | මුදල් රෙගුලාසි ප්‍රකාරව පරීක්ෂණ කටයුතු සිදුකරමින් පවතී. |
| **(ආ) 2018 පෙබරවාරි 20 දිනැති අංක 3/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 9 (iii) ඡේදය** | තම සේවා කාලය තුල සිදු කරන ලද විෂමාචාරයක් සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත ආයතන සංග්‍රහයේ ii වැනි කාණ්ඩයේ 24:3:10 සහ 24:3:11 ඡේද ප්‍රකාරව බරපතල දඩුවම් පමුණුවා සිටින ලදුව විශ්‍රාමගොස් සිටි නිලධාරියෙකු අවිධිමත් පරිදි විදේශ රැකියා අංශයේ අභ්‍යන්තර විගණක ලෙස පත්කර තිබුණි. ඊට අදාල ඉල්ලීම ඉදිරිපත් කිරීමේ අනුමත ආකෘති පත්‍රයේ නියමිත ස්ථානයේ අදාල නිලධාරියාගේ විශ්‍රාම ලැබීමට පෙර සේවා කාලය සතුටුදායක බව හා විනය දඬුවම් ලබා නොමැති බවට කරුණු ඇතුලත් කර නොතිබුණි. | විධිමත් ක්‍රමවේදයක් මත සුදුසුකම්ලත් නිළධාරියකු අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණක තනතුර සඳහා පත් කිරීමට කටයුතු කළ යුතු වීම. | ඉදිරියේදී මෙවැනි බඳවාගැනීම් සිදුකිරීමේදී විගණන විමසුමේ දක්වා ඇති කරුණු පිළිබඳ අවදානය යොමු කිරීමට කටයුතු කරන බව. |

**2. මූල්‍ය සමාලෝචනය**

------------------------

**2.1 වියදම් කලමනාකරණය**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| **(අ)** අමාත්‍යාංශය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ මූලධන ප්‍රතිපාදනයෙන් රු.1,340,802,523 ක් හෙවත් සියයට 58 ක් ඉතිරි කර තිබුණි. | කාර්යභාරය ඉටු කිරීම ආරම්භ වන කාල වකවානු නිශ්චය කර වර්ෂයේදී ඉටු කළ හැකි කාර්ය ප්‍රමාණයට සරිලන පරිදි ප්‍රතිපාදන සලසා ගත යුතු වීම. | හැකි සෑම අවස්ථාවකදීම සාධාරණ පුරෝකථන අනුගමනය කර අයවැය, පිළියෙල කිරීමට කටයුතු කරනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වැය විෂයයන් 18 ක් සඳහා සලසා තිබුණු රු.237,039,750 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණු අතර වැය විෂයයන් 63 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 සිට සියයට 90 දක්වා පරාසයක පැවතිණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. | බිල්පත් ඉදිරිපත් නොවීම, අත්මුදල් නොලැබීම වැනි හේතූන් මත ප්‍රතිපාදන ඉතිරිවී ඇත. |

## 2.2 තැන්පතු ශේෂයන්

--------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වර්ෂ 2 ක් ඉක්ම වූ එකතුව රු.10,849,275 ක් වූ හා වර්ෂ 05 ඉක්මවූ එකතුව රු. 6,365,092 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | එකඟ වෙමි. පොදු තැන්පත් නිදහස් කිරීම සම්බන්ධයෙන් ආපසු ගෙවීමට හෝ මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කිරීමට සටහන් කරගනු ලැබූ බවද සඳහන් කරමි. |

## 2.3 බැරකම් හා බැදීම් වලට එළඹීම

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශය විසින් අනුමත ප්‍රතිපාදන ඉක්මවා රු.771,525 ක බැරකම් වලට එළඹ තිබුණි. | බැරකම් හා බැදීම් පිළිබඳව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත්කරනු ලබන චක්‍රලේඛ විධිවිධාන වලට අනුව කටයුතු කල යුතු වීම. | ඉදිරියේදී ප්‍රතිපාදන ඉක්මවා බැරකම් වලට බැදීමට කටයුතු නොකරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ කුලියට ලබාගත් කාර්යාල ගොඩනැගිල්ල වැඩි දියුණු කිරීමට අදාලව පෞද්ගලික ආයතනයකට ගෙවිය යුතු එකතුව රු.513,450 ක සහතික කරන ලද බිල්පත් වල වටිනාකම බැරකම් ලෙස ගිණුම් ගත කර නොතිබුණි. | සපයාගන්නා ලද සේවාවක් වෙනුවෙන් ගෙවිය යුතුව පැවති බැරකම් ගිණුම්ගත කල කළ යුතු වීම. | කාර්යාල ගොඩනැගිලි අළුත්වැඩියා වැය විෂයන්ගෙන් සියයට 25 ක් අහුරා තැබීම සිදු කල පසු ප්‍රමාණවත් ප්‍රතිපාදන ඉතිරි නොවීම නිසා මෙම මුදල බැරකම් ලෙස දක්වා නොමැත. |

## 2.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය අවසානයට අමාත්‍යාංශයේ පොත් අනුව නිලධාරීන්ට දුන් ණය ශේෂ එකතුව හා අත්තිකාරම් පාලන ගිණුම අනුව ණය ශේෂය රු. 96,404,732 ක් වූ අතර එය භාණ්ඩාගාර පොත් අනුව රු.96,580,230 ක් වූයෙන් අමාත්‍යාංශය හා භාණ්ඩාගාර පොත් අනුව රු.175,498 ක වෙනසක් නිරීක්ෂණය විය. | වෙනස හඳුනාගෙන නිවැරදි කිරීමට ක්‍රියා කළ යුතු වීම. | වෙනසට හේතුව හඳුනාගෙන ඇති අතර එය නිවැරදි කිරීමට කටයුතු යොදා ඇත. |
| (ආ) 2019 දෙසැම්බර් 31 දිනට අයවීම් හිඟහිට තිබුණු රු.116,015 ක් වූ ණය ශේෂය වර්ෂ 04 කට වැඩි කාලයක් ගත වී තිබුණද, අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | විශ්‍රාමයාම, මිය යෑම හෝ සේවය අවසන් කරන නිලධාරීයෙකුගේ ණය ශේෂ අයකර ගැනීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ 4 වගන්තිය ප්‍රකාරව කටයුතු කල යුතු වීම. | අනිවාර්ය විශ්‍රාම ගැනීමට තීරණය කර තිබූ නිලධාරියෙකුගේ රු.116,015 ක් වූ ණය ශේෂය නැවත සේවය පිහිටුවන ලද ලබන ආයතනයෙන් අයකර ගැනීමට කටයුතු යොදා ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) විගමණිකයන්ගේ ආරක්ෂාව සහ සුභ සාධනය යටතේ විගමනිකයාගේ ජීවන මට්ටම වැඩි කිරීම, විගමණික පවුල් මෙරටට පැමිණි පසු විගමණිකයන්ගේ දියුණුව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි අරමුණක් ලෙස හඳුනාගෙන තිබුණද, ඒ යටතේ භෞතික ඉලක්ක හා මූල්‍යමය ඉලක්ක දක්වා නොතිබුණි. | ශ්‍රමික සංක්‍රමණය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති වල නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ඍජුව සම්බන්ධතාවයක් ඇති මෙම වැඩසටහන් අමාත්‍යාංශයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත්කර ක්‍රියාත්මක කළ යුතු වීම. | අමාත්‍යාංශයේ 2019 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව නිරීක්ෂණ ඉදිරිපත් කර ඇත. |

| | | |
|---|---|---|
| (ආ) විදේශ රැකියා අවස්ථා ප්‍රවර්ධනය සඳහා ශ්‍රමික ඉල්ලුමේ ස්වභාවය අවබෝධ කර ගැනීම සහ ශ්‍රමික අවශ්‍යතා ඇති නව අංශ හඳුනා ගැනීම සඳහා විදේශ රටවල ශ්‍රම වෙළඳපල විශ්ලේෂණය හා වෙළඳපල අධ්‍යයනයන් සිදු කිරීමට යාන්ත්‍රණයක් සැලසුම් කොට ක්‍රියාත්මක කිරීම අමාත්‍යාංශය විෂය පථයට ඇතුලත් කාර්යභාර වුවත් සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මෙහි එම කටයුතු ඇතුලත් කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සකස් කිරීම සහ එහි ඇතුලත් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම නිසි සැලකිල්ලෙන් යුතුව සිදුකළ යුතු වීම. | අමාත්‍යාංශයේ 2019 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව නිරීක්ෂණ ඉදිරිපත් කර ඇත. |

**3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම**

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| ----------------------- | --------------- | ------------------------------ |
| අමාත්‍යාංශය විසින් සිය කාර්යභාරය ඉටු කිරීමේදී අවධානය යොමු කළ යුතු ප්‍රමුඛතා ක්ෂේත්‍ර 05 ක් යටතේ අරමුණු 10 ක් ඉලක්ක කර ගනිමින් 2019 වර්ෂය සඳහා සකස් කර තිබුණු වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| (අ) අමාත්‍යාංශය විසින් විදේශ රටවල් සමඟ ඇතිකර ගෙන තිබූ අවබෝධතා ගිවිසුම් අනුව සමාලෝචිත වර්ෂයේ පැවැත්වීමට සැලසුම් කර තිබූ ඒකාබද්ධ කමිටු රැස්වීම් 9 න් 2 ක් පමණක් පවත්වා තිබුණි. | විදේශ රැකියා ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ඇතිකර ගත් අවබෝධතා ගිවිසුම් ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒම සඳහා ඊට අදාල පාර්ශවයන් සමඟ නිරන්තරයෙන් සම්බන්ධතා පවත්වා ගැනීම සහ ගැටලු සාකච්ඡා කිරීම කළ යුතුවීම. | 2019 වර්ෂයේ අවස්ථා 07 කදී ඒ සඳහා ඉල්ලීම් විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. කෙසේ වුවද සැලසුම්කළ පරිදි ඒකාබද්ධ කමිටු රැස්වීම් පැවැත්වීමට නොහැකි විය. |
| (ආ) විදේශ රටවල් සමඟ අළුතින් අවබෝධතා ගිවිසුම් 04 ක් ඇතිකර ගැනීමට සැලසුම් කළද ජපානය සමඟ එක් ගිවිසුමක් පමණක් අත්සන් කර තිබුණි. | විදේශ රැකියා ක්ෂේත්‍රය තුලින් උපරිම ප්‍රතිඵල ලබා ගැනීම සඳහා රටවල් සමඟ රාජ්‍යතාන්ත්‍රික මට්ටමේ සාකච්ඡා පවත්වා අවබෝධතා ගිවිසුම් වලට එළඹීම අත්‍යාවශ්‍ය බැවින් ඒ සඳහා අමාත්‍යාංශය ක්‍රියාකාරීව මැදිහත් විය යුතු වීම. | එකඟවේ |

| | | |
|---|---|---|
| (ඇ) ශ්‍රමික සංක්‍රමණය සම්බන්ධයෙන් ජාතික උපදේශාත්මක කමිටු රැස්වීම් (national advisory committee meetings) 06 ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණද ඉන් 03ක් පමණක් පවත්වා තිබුණි. | ශ්‍රමික සංක්‍රමණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම සඳහා මෙම කමිටු වල ක්‍රියාකාරිත්වය අත්‍යාවශ්‍ය බැවින් නියමිත පරිදි රැස්වීම් පැවැත්වීමට අමාත්‍යාංශය අවධානය යොමු විය යුතු වීම. | ජාතික උපදේශාත්මක කමිටු රැස්වීම් 2 ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණද, රටෙහි පැවති අස්ථාවර තත්වය සහ අමාත්‍යාංශය වෙනත් ස්ථානයකට ගෙනයාම නිසා එක් රැස්වීමක් පමනක් පැවැත්වීමට හැකිවිය. |

**3.3 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 වර්ෂයේ රු.1,000,000 ක ප්‍රතිපාදන මත ඉදිකර තිබුණ නොර්වුඩ් සන්රයිස් ක්‍රීඩාංගණය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියට අදාළව ක්‍රීඩාංගණයේ මීටර් 62.55 ක් දිගට හා මීටර් 4 ක් උසට දැල් ආවරණ යෙදූ බවට දක්වා රු.953,888 ක් ගෙවීම් කර තිබුණද, යොදා තිබූ දැල් ආවරණවල උස මීටර් 3.2 ක් වූයෙන් රු.190,778 ක අධිගෙවීමක් සිදුකර රු.66,772 ක් පමණක් කොන්ත්‍රාත්කරුගෙන් නැවත අයකර ගෙන තිබුණි. කම්බි දැලෙහි ඉහළ සහ පහළ කොටස අපේක්ෂිත පරිදි නිමවා නොතිබුණ බැවින් නියමිත රේටය අනුව ගෙවීම කිරීම සාවද්‍ය බව නිරීක්ෂණය විය. | නියමිත කාලවකවානු තුළ ව්‍යාපෘති ඉටුකිරීමට හැකිවන පරිදි හා අවශ්‍යතා හඳුනාගෙන සැලසුම් විධිමත් පරිදි පිළියෙල කර කාල රාමුව ඇතුලත ඉටුකිරීමට කටයුතු කල යුතු වීම. | විගණනයේදී අනාවරණය වූ ගැටළු නිරාකරණය කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් වෙත 2020 දෙසැම්බර් 03 දින දැනුම් දී ඇත. |

**3.4 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයට අයත් තුංතොට පාලම අසල ඇවිදින මංතීරුවක් ඉදි කිරීම ව්‍යාපෘතිය සඳහා ගිවිසුම්ගත මුදල රු.7,460,000 ක් වූ අතර මංතීරුව සඳහා වැය කර තිබූ සම්පූර්ණ මුදල රු. 9,436,900 ක් වූයෙන් ගිවිසුම් ගත මුදල ඉක්මවා රු. 1,976,900 ක් ගෙවීම් කර තිබුණි. මංතීරුව ඉදි කරන ලද ප්‍රදේශය වර්ෂා කාලයේදී සම්පූර්ණයෙන්ම ජලයෙන් යටවන බැවින් මංතීරුවට යාබදව ඉදිකර තිබූ වාහන අංගනය සම්පූර්ණයෙන් වතුරට ගසා ගෙන ගොස් තිබුණු අතර මංතීරුවේ පිහිටා ඇති කුඹුක් ගස් 20 ක් ඉවත් කිරීමට කටයුතු නොකිරීම නිසා මෙම මංතීරුව, ඇවිදීම සඳහා භාවිතා කළ නොහැකි තත්වයක පැවතුණි. | නියමිත කාලවකවානු තුළ ව්‍යාපෘති ඉටුකිරීමට හැකිවන පරිදි හා අවශ්‍යතා හඳුනාගෙන සැලසුම් විධිමත් පරිදි පිළියෙල කර කාල රාමුව ඇතුලත ඉටුකිරීමට කටයුතු කල යුතු වීම හා කොන්ත්‍රාත් කළමනාකරණය, අධීක්ෂණය හා නියාමනය නිසි පරිදි සිදු කළ යුතු වීම. | මෙම කරුණු පිළිබඳ සවිස්තරාත්මක පැහැදිලි කිරීමක් ලබාදීම සඳහා අනිකුත් අංශ මගින් තොරතුරු ලබා ගත යුතු බැවින් පිළිතුරු ලබාදීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා ඇත. |

මංතීරුවට පස් සපයා අතුරා තැලීම වෙනුවෙන් රු. 900 බැගින් ඝන මීටර් 3500 ක් සඳහා රු. 3,150,000 ක් ඇස්තමේන්තු කර තිබුණද කළ වැඩ වාර්තා අනුව ඝන මීටර් 6320 ක් සඳහා රු. 900 බැගින් රු. 5,688,000 ක් වැය කර තිබීම හේතුවෙන් ඇස්තමේන්තු මුදල ඉක්මවා රු. 2,538,000 ක් ගෙවා තිබුණි.

## 3.5 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------- | ----------- | ---------------------------- |
| (අ) | දියගම මහින්ද රාජපක්ෂ ජාතික ක්‍රීඩා ඇකඩමියේ මීටර් 400 කෘතිම ධාවන පථය සහ වැසිකිළි පද්ධතිය හා පිවිසුම් මාර්ගය සකස් කිරීමේ ව්‍යාපෘති 2 ක් සඳහා පිළිවෙලින් රු. මිලියන 310 ක් සහ රු.මිලියන 15.16 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර 2019 වර්ෂයේදී එම ව්‍යාපෘති සඳහා පිළිවෙලින් රු.මිලියන 183.85 ක් සහ රු.මිලියන 10.3 ක් වැයකර තිබුණි. මෙම ව්‍යාපෘති දෙකෙහි ඉදිකිරීම වැඩ පිළිවෙලින් 2018 දෙසැම්බර් 30 දින හා 2018 අප්‍රේල් 29 දින නිමකළ යුතුව තිබුණද, 2019 වර්ෂය අවසන් වන විටත් නිමකර නොතිබුණි. | නියමිත කාලවකවානු තුළ ව්‍යාපෘති ඉටු කිරීමට හැකිවන පරිදි හා අවශ්‍යතා හඳුනාගෙන සැලැසුම් විධිමත් පරිදි පිළියෙල කර කාල රාමුව ඇතුළත ඉටු කිරීමට කටයුතු කළ යුතු වීම. | අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව පිළියෙල කර ඇත. |
| (ආ) | කුරුණෑගල මලියදේව විද්‍යාලීය වෙඩි තැබීමේ සහ දුනු විදීමේ මධ්‍යස්ථානය ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 12.23 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර 2019 වර්ෂයේදී රු.මිලියන 7.43 ක් වැය කර තිබුණි. 2018 නොවැම්බර් 03 දින නිමකළ යුතු මෙම ව්‍යාපෘතිය 2019 මැයි 23 දින දක්වා කාලය දීර්ඝ කර තිබුණද 2019 දෙසැම්බර් වන විටත් වැඩ නිමකර නොතිබුණි. | - එම - | අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව පිළියෙල කර ඇත. |

## 3.6 විදේශ ආධාර ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ශ්‍රී ලංකාවේ විගමණික සේවකයන් සහ ඔවුන්ගේ පවුල්වල සුරක්ෂිතතාවය සහ සමෘද්ධිය කෙරෙහි දායක වීමේ අරමුණ ඇතිව ස්විට්සර්ලන්ත රජයේ ආධාර මත ක්‍රියාත්මක වෙමින් පවතින ශ්‍රම විගමණ වැඩසටහන (SDC Project) නියාමනය කිරීම විදේශ රැකියා අමාත්‍යාංශය විසින් කළ යුතුව තිබුණද එහි මූල්‍ය හා මෙහෙයුම් කටයුතු පාලනයකින් තොරව සිදුවී ඇති බව පහත සඳහන් කරුණු අනුව නිරීක්ෂණය විය. | | |
| (අ) වැඩසටහනෙහි පළමු අදියර ඇමරිකානු ඩොලර් 699,414 ක මූල්‍ය දායකත්වය මත 2010 දෙසැම්බර් සිට 2013 මාර්තු දක්වා ක්‍රියාත්මක කර තිබුණු බව නිරීක්ෂණය වුවද, එහි ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල අනුමැතියක්, අවබෝධතා ගිවිසුමක් හෝ වෙනත් පැහැදිලි තොරතුරක් විගණනයට ඉදිරිපත් නොවීය. | පවතින මූල්‍ය පාලන නීති රීතිවලට අනුව සහ ශ්‍රී ලංකාවේ විගමණික සේවකයන් සහ ඔවුන්ගේ පවුල්වල සුරක්ෂිතතාවය සහ සමෘද්ධිය වෙනුවෙන් රටට ලැබෙන මුදල් අවභාවිතයකින් තොරව අදාල අරමුණ කරා යොමුකිරීමට අවශ්‍ය මගපෙන්වීම සහ අධීක්ෂණය අමාත්‍යාංශය විසින් සිදුකළ යුතුය | ව්‍යාපෘතියේ භෞතික ක්‍රියාකාරකම් පිළිබඳ අධීක්ෂණය සහ පසුවිපරම් කිරීම සිදුකළ අතර එහි මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් මැදිහත්වීමක් සිදුකර නොමැත. |
| (ආ) ස්විට්සර්ලන්ත රජය සමඟ ශ්‍රී ලංකා රජය 2014 ජූලි 25 දින ඇතිකරගත් ද්විපාර්ශික ගිවිසුමකට අනුව ඇමරිකානු ඩොලර් 3,875,000 ක අරමුදල් දායකත්වය මත වැඩසටහනෙහි දෙවැනි අදියර 2013 මාර්තු සිට 2016 පෙබරවාරි දක්වා ක්‍රියාත්මක කර තිබුණි. 2014 ජූනි 06 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හරහා ආධාර මුදල් ලබා ගැනීමට නිර්දේශ කර තිබුණද එම නියමයක් මෙම ගිවිසුමට ඇතුලත් කර ඒ අනුව කටයුතු කර නොතිබුණි. | - එම - | - එම - |
| (ඇ) විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයකින් හෝ පාලනයකින් තොරව මෙම වැඩසටහනේ තෙවන අදියරද 2016 මාර්තු සිට 2020 පෙබරවාරි දක්වා ක්‍රියාත්මක වෙමින් පැවති අතර ඒ සඳහා රු.503,539,342 ක් ශ්‍රී ලංකාවට ලැබී තිබුණි. මෙම වැඩසටහන එකහතා | - එම - | - එම - |

| | | |
|---|---|---|
| ලිපියක් මඟින් ක්‍රියාත්මක කර තිබුණු අතර මේ සඳහා රජයේ එකඟතාවය ලබාගැනීමට හෝ අවබෝධතා ගිවිසුමක් ඇතිකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ඇ) ශ්‍රී ලංකා රජය වෙනුවෙන් මෙම වැඩසටහන අමාත්‍යාංශය විසින් නියාමනය කළ යුතු වුවද 2016 මාර්තු සිට 2020 පෙබරවාරි දක්වා කාලය තුළ මෙම වැඩසටහන සඳහා රු. 503,539,342 ක් වූ අරමුදල් උපයෝජනය සම්බන්ධයෙන් හෝ තොරතුරු අමාත්‍යාංශය සතුව නොතිබුණි. විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හරහා මුදල් නොලැබීම හේතුවෙන් රාජ්‍ය නිළ සංක්‍රාම ලෙස මෙම මුදල් ගණනය නොකෙරෙන අතර 2020 පෙබරවාරි මාසයේ දී ව්‍යාපෘති කාලය අවසන් වීමට නියමිත වුව ද, අවම වශයෙන් එකඟතා ලිපියක් හෝ රහිතව 2020 අගෝස්තු 11 දින දක්වාත් මෙම වැඩසටහන ක්‍රියාත්මක වෙමින් පැවතුනි. | - එම - | - එම - |

**3.7 වත්කම් කළමනාකරණය**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ)** අමාත්‍යාංශයට අයත් ටොයෝටා ජීප් රථයක් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත මුදාහැර තිබුණි. | වත්කම් වෙනත් ආයතනවලට පැවරීමේ දී අමාත්‍යාංශයේ අරමුණු ඉටු කිරීමට බාධාවක් නොවන පරිදි විධිමත්ව කටයුතු කළ යුතු වීම. | ජීප් රථය මෙම අමාත්‍යාංශයට භාර දීමට කටයුතු කරන ලෙස 2018 දෙසැම්බර් 18 දින ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත දැනුම් දී ඇත. |
| **(ආ)** විදේශ රැකියා අංශයේ හිටපු නියෝජ්‍ය අමාත්‍යවරයා වෙත නිකුත් කර තිබූ ජංගම දුරකථනයක් හා ලැප්ටොප් පරිගණකයක් අමාත්‍ය කාර්යාලය ඉවත් කර වර්ෂයකට වැඩි කාලයක් ගතවී තිබුණද ආපසු භාර ගැනීමට කටයුතු කර නොතිබුණි. | එම වත්කම් අමාත්‍යාංශ පරිහරණය සඳහා නැවත ලබාගැනීමට කටයුතු කල යුතු වීම. | නියෝජ්‍ය අමාත්‍යවරයා වෙත නිකුත් කර තිබූ ඇපල් අයි 7 දුරකථනය **HPi5** ලැප්ටොප් පරිගණකය අමාත්‍යාංශය වෙත භාර දී නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | හිටපු අමාත්‍යාංශ ලේකම් වෙත නිකුත් කර තිබූ ලැප්ටොප් පරිගණකය ස්ථාන මාරු වී යාමේදී භාර ගැනීමට කටයුතු කර නොතිබුණි. | - එම - | පරිගණකය නව අමාත්‍යාංශය වෙත රැගෙන ගොස් තිබුණු අතර නිකුත් කිරීමේ නියෝග නිකුත් කර තිබුණද එම අමාත්‍යාංශයේ ගබඩා පොත් වල සටහන් කල බවට ලැබීම් විස්තර අමාත්‍යාංශය වෙත ලැබී නොතිබුණි. |
| (ඈ) | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් මෝටර් රථයක් ක්‍රීඩා අමාත්‍යාංශය විසින් විධිමත් අනුමැතියකින් තොරව උපයෝජනය කර තිබුණි. | එම වත්කම් විධිමත්ව පවරා ගැනීමට කටයුතු කළ යුතු වීම. | රාජකාරි අවශ්‍යතාමත මෙම වාහන හුවමාරු කරගෙන ඇති අතර කඩිනමින් විධිමත් පරිදි පවරා දීමට හා පවරා ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |

**3.8 කළමනාකරණ දුර්වලතා**

---------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ----------- | ------------------------- |
| සමාලෝචිත වර්ෂයේදී රු.1,700,000 ක මාසික කුලී පදනම මත හදිසි අවශ්‍යතාවයක් සේ සලකා අමාත්‍යාංශයේ විදේශ රැකියා අංශයේ කාර්යාලය නව ගොඩනැගිල්ලකට මාරු කර තිබුණ අතර මේ සඳහා රු.11,417,505 ක අමතර පිරිවැයක් සිදු කර තිබුණි. මෙම කාර්යය සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන සලසා නොතිබුණු බැවින් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙන් රු.මිලියන 22 ක ණය මුදලක් ලබාගෙන තිබුණි. තෝරාගත් ගොඩනැගිල්ලෙහි තෙකලා විදුලිය, දුරකථන හා ජල සැපයුම් පහසුකම් පවතින බව සැපයුම්කරුගේ මිල ගණන් ඉදිරිපත් කළ ලියවිලිවල දක්වා ඇතත්, එම පහසුකම් නොමැති බව තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව අනුව නිරීක්ෂණය විය. ලංසු ඇගයීමේදී ඒ පිළිබඳව සැලකිල්ලක් දක්වා නොතිබුණි. ඉල්ලා තිබුණු ටපිරිවිතරයන් අනුකූල නොවීම් මසක් ඇතුලත සම්පූර්ණ කර දෙන ලෙස සහතිකයක් ලබාගෙන වර්ග අඩියකට රු. 139.15 ක් වූ අවම මිල ඉදිරිපත් කළ සැපයුම්කරුගෙන් ගොඩනැගිල්ල කුලියට ගැනීමට අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව | මෙම ප්‍රසම්පාදනයේ සිදුවූ වැරදි හා අඩුපාඩු සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන් හඳුනා ගැනීම සඳහා විධිමත් පරිදි පරීක්ෂණ කටයුතු සිදුකිරීම හා ඒ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදුකළ යුතු වීම සහ ප්‍රසම්පාදන කටයුතු වලට අදාළ අභ්‍යන්තර පාලනය ක්‍රමවත් ලෙස ක්‍රියාවට නැංවිය යුතු වීම. | කාර්යමණ්ඩලයට ප්‍රමාණවත් ඉඩක් පෙර පැවති ගෙඩනැගිල්ලහි නොමැති වීම, ප්‍රමාණවත් පහසුකම් නොමැති වීම, මාර්ග තදබදය හේතුවෙන් ගමනාගමනය අපහසුවීම, මේ සඳහා වෙනත් රජයේ ගොඩනැගිල්ලක් නොතිබීම, පෙර පැවති ගොඩනැගිල්ලෙහි කුලී කාලය අවසන්වීම වැනි හේතු අනුව නව ගොඩනැගිල්ලකට අමාත්‍යාංශ කාර්යාලය මාරු කිරීමට සිදු විය. |

තීරණය කර තිබුණි. නමුත් අපේක්ෂිත පිරිවිතරයන්ට හා සාපේක්ෂව සැලකිය යුතු බැහැරවීම් නිරීක්ෂණය නොවූ වර්ග අඩි රු.140 ක් අගය වූ දෙවැනි අවම මිල ඉදිරිපත් කර තිබූ සැපයුම්කරු තෝරා ගැනීමට හේතුන් ඉදිරිපත් කර නොතිබුණි. තෝරාගත් ගොඩනැගිල්ලෙහි, අමාත්‍යාංශ නිලධාරින්ට වෙන්වූ කාමර පවතින බව තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාවෙහි සඳහන් කර ඇතත් ගොඩනැගිල්ල කුලියට ගැනීමෙන් පසු එහි කාමර වෙන්කිරීම් සහ අභ්‍යන්තර අලංකරණ කටයුතු සඳහා රු.11,072,504 ක් වැයකර තිබුණි. එහෙත් ගොඩනැගිලි හිමිකරු සමඟ බදු ගිවිසුම අත්සන් කිරීමට ප්‍රථමයෙන් භෞතික පරීක්ෂණයේදී හඳුනාගෙන තිබූ අඩුපාඩු සම්පූර්ණ කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**4. තිරසර සංවර්ධන**

**4.1 තිරසර සංවර්ධන අරමුණු හඳුනා ගැනීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2019 වර්ෂයට අදාළව අමාත්‍යාංශයේ ක්‍රීඩා අංශය විසින් තිරසර සංවර්ධන අරමුණු සකස් කර නොතිබුණි. | අමාත්‍යාංශය විසින් තිරසර සංවර්ධන අරමුණු සකස් කළ යුතු වීම. | 2021 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට ක්‍රියාකාරි සැලැස්මේ සිටම අවශ්‍ය පියවර මේවන විට යොදා ඇත. |
| (ආ) | අමාත්‍යාංශයේ විදේශ රැකියා අංශය විසින් සිය සැලසුම් වල ඇතුලත් කර තිබූ කාර්යයන් හා උපකාර්යයන් ඉටුකර ගැනීම සංඛ්‍යාත්මකව මැන බැලීමට හැකි වන දර්ශකයන් පමණක් ස්ථාපනය කර තිබූ බැවින් තිරසර සංවර්ධන අරමුණු වල නිමැවුම පමණක් ඇගයීමේ හැකියාව පැවතුණද ප්‍රතිඵලය සහ දීර්ඝ කාලීන බලපෑම මෙම සැලසුම් කරන ක්‍රියාවලිය තුලින් මැන බැලීමේ හැකියාව නොතිබුණි. තවද, සපුරාගත යුතු ඉලක්කයන් අනුව පවතින පරතරයන් හඳුනා ගැනීම සහ ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීමක් සිදුකර නොතිබුණි. | අරමුණු ඉටුකර ගැනීම සඳහා සපුරාගත යුතු ඉලක්කයන් හා එම ඉලක්කයන් සපුරා ගැනීම සඳහා පවතින පරතරයන් (Gap) මෙන්ම ප්‍රගතිය මැන බැලීම සඳහා සුදුසු දර්ශකයන් (Key Performance Indicators) හඳුනාගත යුතු වීම හා අදාල අරමුණු ළඟාකර ගත් ප්‍රමාණය, ඉන් බැහැරවීම් මෙන්ම අවධානය යොමු විය යුතු විශේෂ ක්ෂේත්‍රයන් හඳුනා ගත හැකි වන පරිදි ගෝලීය දර්ශකයන්ට සමගාමීව එම දර්ශකයන් ස්ථාපනය කළ යුතු වීම. | තිරසර සංවර්ධන ඉලක්ක ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර ඇත. ඉදිරි වර්ෂයන්හිදී ප්‍රතිඵල සහ බලපෑම අගය කිරීම සඳහා කාර්යසාධන දර්ශක ඇතුලත් කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කරනු ඇත. ඉදිරි සැලසුම් සකස් කිරීමේ දී මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරමි. |

| | | |
|---|---|---|
| (ඇ) ස්විඩන් රජයේ ආධාර මත විගමනය පිළිබඳ ජාත්‍යන්තර සංවිධානය (international organization for migration ) හි මැදිහත් වීමෙන් විගමණික පාලන දර්ශකය සකස් කර 2018 වර්ෂයේදී ප්‍රකාශයට පත්කර තිබුණු අතර එමගින් එක් එක් රටවල විගමන පාලන ආකෘතිය ඇගයීමත් විගමනය සම්බන්ධ තිරසර සංවර්ධන ඉලක්කයන් ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැපයීමත් අරමුණු වී තිබුණි. ප්‍රධාන විෂයන් 06 ක් යටතේ මෙම දර්ශකයන් ප්‍රකාශයට පත්කර තිබූ අතර මෙම විගමන පාලන දර්ශකය මඟින් ඇගයීමට ලක්කර තිබූ කරුණු වලින් ඉෂ්ට කර ගැනීමට නොහැකි වී තිබූ සහ තවදුරටත් වැඩිදියුණු විය යුතු ක්ෂේත්‍ර සම්බන්ධයෙන් කිසිදු කාර්යයක් හෝ උපකාර්යයක් අමාත්‍යාංශයේ විදේශ රැකියා අංශය විසින් තිරසර සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීමේදී ඇතුලත් කර නොතිබුණි. | සියලුම ආයතනවල ඉහල කළමණාකාරිත්වයේ සහභාගිත්වයෙන් වැඩමුළුවක් පවත්වා තිබුණු බැවින් එහි ඇතුලත් කරුණු පිළිබඳව කළමණාකරනය විසින් අවධානය යොමු කර ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනය වෙනුවෙන් කටයුතු කළ යුතු වීම. | විගණනය සඳහා ඉදිරිපත්කරන ලද තිරසර සංවර්ධන සැලැස්ම තුල මෙම දර්ශකයෙහි ඇතුලත් කරුණු වෙන් වෙන්ව පෙන්වා දී නොමැති වුවද,යාවත්කාලීන කරමින් පවතින අමාත්‍යාංශ ජාතික ප්‍රතිපත්තියෙහි වැඩි දියුණු විය යුතු ක්ෂේත්‍රයන්වලට අදාල ක්‍රියාකාරකම් ඇතුලත් කර ඇත. |

## 5. යහපාලනය

### 5.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දිමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අමාත්‍යාංශයේ විදේශ රැකියා අංශයේ අභ්‍යන්තර විගණක තනතුර 2018 මැයි 15 දින සිට 2019 නොවැම්බර් 30 දින දක්වා පුරප්පාඩුව පැවතුන අතර 03 දෙනෙකුගෙන් යුත් කාර්යය මණ්ඩලයක් විසින් එහි කටයුතු සිදුකර තිබුණි. 2019 වර්ෂය තුළ විගණන විමසුම් 3ක් පමණක් නිකුත් කර තිබුණු අතර අභ්‍යන්තර විගණන ඒකකය වෙත ඉදිරිපත් වී තිබූ පැමිණිලි 30 කින් 2019 මැයි 10 දින වන විට පැමිණිලි 25 ක විමර්ශණ කටයුතු සිදුකර නොතිබුණි. | අභ්‍යන්තර විගණන ඒකකය සඳහා නිලධාරීන් අනුයුක්ත කර තිබුණද එම නිලධාරීන් මඟින් විගණනය කර ගැනීමට නිසි වැඩපිළිවෙළක් නොතිබුණු බැවින් එම තත්ත්වයන් මඟහරවා ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතු වීම. | මෙම ඒකකය සඳහා ප්‍රමාණවත් කාර්යයමණ්ඩලයක් නොතිබුණු බැවින් අපේක්ෂිත කාර්ය සාධනය ලගාකරගත නොහැකි විය. |

## 6. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විට ජ්‍යෝෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 06 ක් ඇතුළුව මුළු පුරප්පාඩු 24 ක් පිරවීමට අමාත්‍යාංශයේ ක්‍රීඩා අංශය අපොහොසත් වී තිබුණි. | පුරප්පාඩු පිරවීම සඳහා අප්‍රමාදව ක්‍රියා කළ යුතු වීම. | ජ්‍යෝෂ්ඨ මට්ටමේ පුරප්පාඩු සියල්ලම පාහේ මේවන විට සම්පූර්ණව ඇති බවද කාරුණිකව සඳහන් කරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට විදේශ රැකියා අංශය සඳහා අනුමත කාර්යය මණ්ඩලය වූ 1068 කින් 999 ක් සේවයේ නියුක්තව සිටි අතර ඉන් 949 ක් සංවර්ධන නිලධාරීන් වූ අතර විධායක මට්ටමේ තනතුරු 11 කින් 02 ක් පුරප්පාඩුව පැවතුණි. එමෙන්ම ද්විතීක මට්ටමේ පුරප්පාඩු 63 ක් පැවති අතර ඉන් 40 ක් සංවර්ධන නිලධාරීන් බව නිරීක්ෂණය විය. | ආයතනයේ අරමුණු ඉටුකර ගැනීමට ප්‍රමාණවත් කාර්යමණ්ඩලයක් අනුමත කර ගැනීමට සහ දැනට සිටින කාර්යමණ්ඩලය නිසි කළමණාකාරිත්වයක් යටතේ පරිපාලනය කිරීමට කළමණාකරන අවධානය යොමු විය යුතු වීම. | අමාත්‍යාංශයේ අවශ්‍යතාවය අනුව පවතින පුරප්පාඩු පිරවීමට කටයුතු සිදුකරමින් පවතී |